**ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## 1.1 මතය

------

2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බවට,

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ටැබ් පරිගණක 350 ක් මිලදී ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් ලබා ගෙන තිබුණු රු.17,500,000 කින්, රු.12,075,000 ක් පමණක් වැය කර තිබුණු අතර, ඉන් සියයට 31 ක් හෙවත් රු. 5,425,000 ක් ඉතිරි කර තිබුණි. | එකක් රු.50,000 බැගින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ටැබ් යන්ත්‍ර 350 ක් මිලදී ගැනීමට දළ ඇස්තමේන්තුව අනුව රු. 17,500,000 ක අතිරේක ප්‍රතිපාදන ලද අතර විවෘත තරගකාරී මිල ගණන් කැඳවීම හේතුවෙන් එකක් රු.34,500 බැගින් මිලදී ගැනීම හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදුවිය. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ<br><br>2018 ඔක්තොබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 4 ජේදය | 44,250,000 | 2019 මාර්තු 31 දිනට පෙර දෙපාර්තමේන්තුව භාවිතා කළ වාහනවල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, වරින්වර අදාළ අමාත්‍යාංශය වෙනස්වීම සහ කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා දි ඇති | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය සහ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ඉඩම් අමාත්‍යාංශය හා සම්බන්ධව පැවති අවස්ථාවල ලබා දී ඇති නමුත් අමාත්‍යාංශ සංශෝධනය කිරීමේදී නව අමාත්‍යාංශවලට වෙන් වී ඇති බැවින් අදාළ වාහන අප දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කරන | අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරමින් වාහන දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වාහනවල අයිතිය කල්බදු අවසන්ව ලංකා බැංකුව විසින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දී නොමැතිවීම යන හේතු නිසා රු. 44,250,000 ක් වටිනා වාහන 9 ක් දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ගැනීමට නොහැකි වී තිබුණි. | ලෙස අදාළ ආයතන ප්‍රධානීන් වෙත ලිපි යොමු කර ඇත. කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඇති වාහන 06 ක් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා දී ඇති අතර කල්බදු අවසන්ව ලංකා බැංකුව විසින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත අයිතිය පවරා දුන් පසු මෙම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට හැකි බව සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 3.1 දැක්ම හා මෙහෙවර
----------------------

දැක්ම හා මෙහෙවර සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ දැක්ම වන “ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස පරිහරණය කිරීම” සඳහා “පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම” යන දෙපාර්තමේන්තුවේ මෙහෙවර වෙනුවෙන්, ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සැකසීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා 2018 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන එම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම ප්‍රමුඛ කටයුත්තක් සේ සලකා කටයුතු කර ඇත. මෙම වර්ෂය වන විට එහි අවසාන මට්ටමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකසා අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව සතුව වාහන 33 ක් පවතින අතර, 2021 වර්ෂය තුළදී වාහන නඩත්තුව සඳහා රු. 6,808,378 ක් ද, වාහන පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් සඳහා රු. 2,843,951 ක් ද වශයෙන් එකතුව රු. 9,652,328 ක් වැය කර තිබුණි. ඒ පිළිබඳව සිදු කරන ලද නියැදි පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු හා කාර්යාලවල වාහන අලුත්වැඩියා සඳහා සිදුවන විශාල කාල ප්‍රමාදයන් වලක්වා ගැනීමට කොළඹ තිබෙන වාහන සම්බන්ධයෙන් කොළඹ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවල සහ කෝට්ටේ නගර සභා සීමාවල පිහිටි ගරාජවලින් මිල ගණන් කැඳවීමත්, වාහන අලුත්වැඩියා කිරීමට ප්‍රවීණත්වයක් දරන ගරාජවලින් ටෙන්ඩර් කැඳවීමත් කළ යුතු වූ අතර, පළාත් සම්බන්ධයෙන්ද අදාළ පළාතේ ප්‍රධාන නගරයේ පිහිටි ගරාජවලින් තෝරා ගත යුතු විය. එසේ වුවද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සංචිත වාහන හතක සහ පිට පළාත්වල වාහන පහක එකතුව රු.1,523,679 ක් වූ අලුත්වැඩියා සහ වැඩි දියුණු කිරීම් කටයුතු එම කාර්යාල පිහිටි බල ප්‍රදේශවලින් බැහැර මාළඹේ පිහිටි පුද්ගලික ගරාජ දෙකකින් සිදු කර තිබුණි. | ප්‍රධාන කාර්යාලය හරහා සිදු කරනු ලබන අලුත්වැඩියාවන් ඉඩම් අමාත්‍යාංශය වෙතින් ලබා ගත් රජයේ ලියාපදිංචි ආයතනවලින් කරන අතර ඉදිරියේදී රා.ප.ච. 30/2016 එහි 4.4 ඡේදය අනුව කටයුතු කිරිමට සහ එහි දක්වා ඇති පරිදි මිල කැඳවීමට සුදුසු ආයතන ගැන සොයා බලා ඒ අනුව කටයුතු කරනු ලැබේ. ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධාන අලුත්වැඩියා පමණක් නියෝජිත ආයතන මඟින් කරනු ලබන අතර දිස්ත්‍රික් කාර්යාලවල නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම නිසා ප්‍රධාන කාර්යාලය හරහා ප්‍රධාන අලුත්වැඩියා සිදු කරනු ලැබේ. | පරීක්ෂණයක් සිදු කර ඉදිරි පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| **(ii)** 2021 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලයේ රාජකාරී කටයුතු සඳහා වෙන් කර තිබුණු අංක 61-2377 දරන වෑන් රථය වෙනුවෙන් අවස්ථා දෙකකදී එකතුව රු. 322,510 ක්ද, පුත්තලම දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලයේ භාවිතය සඳහා ලබා දී තිබුණු අංක JV-1497 දරන කැබ් රථය වෙනුවෙන් අවස්ථා දෙකකදී රු.346,535 ක්ද වැය කරමින් එන්ජින් අභ්‍යන්තර අලුත්වැඩියා සිදු කර තිබුණද, 2022 ජනවාරි 25 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අංක 61-2377 දරන වෑන් රථය පනගැන්විය නොහැකි බවත්, අංක JV-1497 දරන කැබ් රථය 2021 සැප්තැම්බර් 23 දින ඔයිල් නළයක් ගැලවී එන්ජින් ඔයිල් සියල්ල ඉවත් වී තිබුණු බවත් නිරීක්ෂණය විය. | 61-2377 අලුත්වැඩියාවෙන් පසු ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නිර්දේශ ලබා ගන්නේ ඒ පිළිබඳව තාක්ෂණික දැනුම ඇති නිලධාරියකුගෙන් වේ. මෙම කටයුත්ත සම්බන්ධයෙන් රියදුරු විසින් 2022 මාර්තු 08 දින කරන ලද දැනුවත් කිරීම අනුව එහි ඔල්ටනේටරය හා හිටර් මීටරය අළුත්වැඩියාව කාර්මික නිලධාරි විසින් නිර්දේශ කර ඇත. එහි සඳහන් අලුත්වැඩියාවන් අතුරින් ලබා දී ඇති වගකීම් කාලය තුළ පවතින අලුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කරන ලෙස අදාළ ආයතනය වෙත දන්වා ඇති අතර එයට පරිබාහිර අලුත්වැඩියාවන් සඳහා මිල ඇස්තමේන්තු කැඳවා අළුත්වැඩියා කිරිමට කටයුතු කරනු ලැබේ.<br>JV-1497 අලුත්වැඩියාව පෙර සිදු කරන ලද එන්ජිමේ අළුත්වැඩියාව හා සම්බන්ධ නොවන බවට කාර්මික නිලධාරි විසින් නිර්දේශ කර ඇති බැවින් අදාළ අලුත්වැඩියාව සිදු කර ඇත. | පරීක්ෂණයක් සිදු කර ඉදිරි පියවර ගත යුතුය. |
| **(iii)** පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයේ අංක JV-1497 දරන කැබ් රථයේ දෙවෙනි වර එන්ජින් අලුත්වැඩියාව 2021 ඔක්තෝබර් 26 දින සිදු කර රියදුරු විසින් 2021 නොවැම්බර් 03 දින රථය ආපසු භාර ගෙන තිබුණි. දෛනික ධාවන සටහන් අනුව එම කාලය තුළදී ගරාජය විසින් මෙම රථය කිලෝමීටර 427 ක් ධාවනයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. | ගරාජය විසින් රථය යම් කිසි දුරක් පරික්ෂණ ධාවනයේ යොදවන නමුත්, මෙවැනි දුරක් ධාවනය කිරිම සම්බන්ධයෙන් අදාළ ආයතනයෙන් හේතු විමසා ඇති අතර, ඒ අනුව ඉදිරි පියවර ගනු ලබන බව සඳහන් කරමි. | පරීක්ෂණයක් සිදු කර ඉදිරි පියවර ගත යුතුය. |
| **(iv)** මහවැලි අධිකාරිය විසින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා 2008 වර්ෂයේදී පවරා දී ඇති අංක 32 – 6748 දරන ජීප් රථය 2016 ජනවාරි සිට 2022 අප්‍රේල් දක්වා ධාවනය නොකර, දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගාල් කර තිබුණු මුත් 2019 වර්ෂයේ සිට 2022 මාර්තු 30 දින දක්වා වරින් වර | මෙම වාහනයේ අයිතිය සම්බන්ධයෙන් ගැටලුව නිරාකරණය වී ධාවනය සඳහා යෙදවීමට කටයුතු කිරීමේදී රියදුරු විසින් රථය ධාවනය කිරීමට නොහැකි තත්ත්වයක පවතින බැවින් අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව මෝටර් රථ ප්‍රවාහන | පරීක්ෂණයක් සිදු කර ඉදිරි පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු.1,055,011 ක අලුත්වැඩියා වියදමක් දරා තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | පරීක්ෂක විසින් රථය පරීක්ෂා කර නිර්දේශ කිරීමෙන් පසු අලුත්වැඩියා කරන ලදි. අලුත්වැඩියාවෙන් පසු 2019 අප්‍රේල් 25 දින රක්ෂණාවරණය හා දුම් සහතික ලබා ගෙන ඇති අතර අයිතිය පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ ගැටළුවක් මතු විය. මේ වන විට සියලු කටයුතු නිරාකරණය කරගෙන ඇති අතර එම වාහනය ධාවන තත්ත්වයේ පවතී. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් 4 දෙනෙකුද ඇතුළුව තථ්‍ය සංඛ්‍යාව 623 ක් වූ බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 16 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩුවක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 42 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් සමඟ මුළු පුරප්පාඩු 78 ක් පැවතියද, කොවිඩ් 19 වසංගතය ඇතුළුව රටේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වයන් මතද ගැටලුවකින් තොරව ආයතනය පවත්වාගෙන යාම සඳහා පවතින මානව සම්පත් කළමනාකරණය කර ගැනීමට කටයුතු කර ඇති බව 2021 කාර්යසාධන වාර්තාවේ සඳහන් කර ඇති බැවින්, අනුමත සේවක සංඛ්‍යාවන් පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කළ යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | මෙම පුරප්පාඩු තනතුරු දෙපාර්තමේන්තුවට අවශ්‍ය වුවද විටින් විට පනවන ලද චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති අතර එය දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර කටයුත්තක් වේ. දැනට තත්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගනිමින් කටයුතු කළද තවදුරටත් සේවාවන් පුළුල් කිරීම ගැටළුවක් වී ඇති අතර දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු සිදුකර ඇත. | අනුමත තනතුරුවලට සේවකයින් බඳවා ගැනීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |